මිෂන් සභා චක්‍ර ලේඛ අංක:11/94

මගේ අංකය:බප/සසේකො/ලේ.කි,
සමුපකා ර සේවක කො මිෂන් සභාව(බ.ප.),
මහ ලේකම් කාර්යාලය - 3 වන මහල,
මාලිගාවත්ත - කො ළඹ - 10.
1994 දෙසැම්බර් මස 13 දින.

නාහිර පළාතේ,
ලම සමුපකාර සමිති සභාපතිවරුන් වෙත.

විනය පරීක්ෂණ නිගමනයන් සම්බන්ධයෙන් සමිතියේ පාලන මණ්ඩලය සෑහීමකට පත් නො වන අවස්ථා.

---

1. විධිමත් විනය පරීක්ෂණයකින් පසු විනය පරීක්ෂණ නිලධාරීගේ නිගමන හා සමඟ තමන් එකඟ නො වන බව කියමින් සමුපකාර පාලක මණ්ඩල විසින් තම සේවකයන් වෙත දඬුවම් පමුණුවන හා ඔවුන් සේවයෙන් පහ කරනු ලබන නොයෙක් අවස්ථාවන් කො මිෂන් සභාව වෙත වා ර්තා වී ඇත. එහෙත්, එවැනි අවස්ථාවලදී තමන් විනය පරීක්ෂණ නිගමන සමඟ එකඟ නො වන්නේ කුමන හේතූන් මත දැයි විග්‍රහයක් නොකර රෙගුලාසි 114 යටතේ ආවරණය වීමට පමණක් බොහෝ සමිති උත්සාහ දරා ඇත. එහෙයින්, මින් මතුවට එවැ නි අවස්ථාවන්හිදී පහත සඳහන් පරිදි කටයුතු කිරීමට වගබලා ගන්නා හැටියට සියළු සමිති වෙත කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. විනය පරීක්ෂණ නිලධාරීන්ගේ නිගමනයන් සමඟ පාලක මණ්ඩලය සෑහීමකට පත් නොවන අවස්ථාවලදී

(අ). එසේ තමන් සෑහීමකට පත් නො වන්නේ නම්, මේ හේතූන් නිසා යයි, විනය පරීක්ෂණයේදී ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුසාරයෙන් ඒ පිළිබඳව ඒත්තු ගත හැකි සම්පූර්ණ වාර්තා වක් සකස් කළ යුතු අතර, එහි පිටපතක් විනය පරීක්ෂණ වාර්තාවේ ඇමිණිය යුතුය.

නැතහොත්,

(ආ). පාලක මණ්ඩලය විසින්ම නැ වත පරීක්ෂණයක් කර එම පරීක්ෂණ සටහන් අනුව තීරණයක් ගත යුතුය.

03. ඉහත සඳහන් ක්‍රියා මාර්ගයන්ගෙන් එකක් හෝ අනුගමනය නොකර විනය පරීක්ෂණ නිලධාරීගේ නිගමන සමඟ එකඟ නො වන බව පමණක් කියමින් සේවකයන් වෙත දඬුවම් පැනවීමට සමිති විසින් ගනු ලබන තීරණයක් බැලු බැල්මට ප්‍රතික්ෂේප කිරීමට කොමිෂන් සභාවට සිදු වන බව කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි. තවද, මේ සම්බන්ධයෙන් සමුපකාර සේවක කොමිෂන් සභාව නිකුත් කර ඇති චක්‍රලේඛ අංක:155/87 හා 1987.04.06 දින දරණ චක්‍රලේඛයේ විධිවිධාන මින් ඉදිරියට වලංගු නොවන බව ද කො මිෂන් සභාවේ නියමය පරිදි වැඩිදුරටත් දන්වමි.

(පී.ඩී.චන්ද්‍රදාස),
ලේකම්,

පිටපත්:-1.ලේකම් - කෘ.ප.පා.හා.සමු.අ.(බ.ප.).
2.සමු.සං.කො./රෙ.(බ.ප.).
3.ස.සං.කො/රෙ.